කෙටි කතාව



# කෙම් බිමක තනිවී

වෙලාව උදෑසන නවයත් පසුවී ගොස්ය. කාන්තිමත් හිරු රැ ස් ජනේලයේ සේද තිර අතරින් කාමරය පුරා ගලයි. නිමාලිකා ඇඳෙන් නැගිට ගොස් ජනෙල් තිර මෑත් කොට අවට බැලුවාය.

හුඟ දවසකට පස්සෙ හොඳට ඉර පායල.. ඇගේ සිතට සතුටක් දැනුණි. සීත සමයේ හොඳින් ඉර එළිය දැකිය හැක්කේ කලාතුරකින් දවසකය. බොහෝ දිනවල අහස අඳුරුය. වටපිටාව මීදුමෙන් වැසුණු ගමන්ය. දැරිය නොහැකි තරම් අධික සීතලට අමතරව පසුගිය දින කීපය පුරා නොකඩවා වැසි ඇද හැලුණි. පහත මිදුලේ තණ නිල්ල ඒ වැසි නිසා අළුතින් පණ ලැබූ සෙයක් පෙනුණි. යාබද නිවසේ වහලේ දුම් කවුළුව තුලින් සුදු පැහැති දුම් රොටු වායු තලයට එක් වෙයි. කෝට්නි යුවල ගිනි උදුන ළඟ වාඩිවී කෝපි බොමින් සිටින අයුරු ඇයට සිතින් මවා ගත හැකිය. පහත් බිමේ ගෙවල් වලට උඩින් දකුණු පසින් පෙනෙන කඳු පේලියද හිරු එළිය නිසා වඩාත් පියකරුව දිස්වෙයි. තැනින් තැන තණ උලා කන බැටළුවන් සුළඟින් චංචල වන කුඩා පුළුන් බෝල මෙනි. විශාල තණ බිමේ හුදකලාව නැගී සිටින පයින් ගස් කීපයක් හැරුණු විට නිල්වන් අහසේ දැක්මට බාධා කරන කිසිවක් නැත.

නිමාලිකා මෙහි පදිංචියට ආවේ පසු ගිය පෙබරවාරියේය. එතෙක් ශිෂ්‍ය නේවාසිකාගාරයේ නැවතී සිටි ඇයට ටික දිනකින්ම එහි ගත කරන ජීවිතය එපා විය. මුලින්ම නේවාසිකාගාරයේ බොඳුන් හලේ කෑම ඇයට අප්‍රිය විය. පසුව එකම කාමරයේ නවාතැන් ගෙන සිටි අනිකුත් සිසුවියන්ගේ ජීවන රටාව ඇයට පීඩා ගෙන දෙන්නක් විය. උදෑසන සිට දේශන සඳහා සහභාගි වී අවශ්‍ය සටහන් සොයා ගැනීම සඳහා පුස්තකාලයේද පැය කීපයක් ගත කොට කාමරයට එන්නේ නිවී සැනසිල්ලේ ටිකක් නිදා ගන්නට සිතා ගෙනය. නමුත් බොහෝ දිනවල ඊට ඇති ඉඩකඩ ඉතා අල්පය. කාමරය හෙලන්ගේත් ස්ටෙප්නිගේත් මිතුරු මිතුරියන්ගෙන් පිරෙයි. විශේෂයෙන්ම සිකුරාදා රෑට සහ සති අන්ත දිනවලට ඇති කරදරය කෙතරම්දැයි කිව නොහැකි ය. මුල් දිනවල ඔවුන්ගේ මත්පැන් සාද සඳහා නිමාලිකාවද එකතු කර ගැනීමට උත්සාහ දැරුවද ඔව්හු පසුව එම උත්සාහය අත් හැර දැමූහ. තමා සිංහල බෞද්ධයෙකු නිසා කිසි දිනක මත්පැනට අත නොතබන බව ඇය දැඩිව කියා සිටි නිසාය. තරමක් මත් වී රෑ දෙගොඩහරියේ කාමරයෙන් පිට වන ඔවුන් නැවත එන්නේ එළි වන ජාමයේය. සමහර දිනෙක පසුදා සවස් වන තුරුම කොහේ හෝ කමින් බොමින් විනෝද වෙමින් ගත කොට නිදිබර විඩාපත් මුහුණු වලින් යුතුව කාමරයට වදිති. වරෙකට ඔවුන් දෙදෙනාම හොඳ මිතුරියෝය. තවත් වරෙකට එකිනෙකා නොරුස්සමින් කෑ ගසා ගනිති. මේ සියල්ලෙන් මිදී නිදහස් තැනකට යා යුතුයයි සිත සිතා සිටින විටෙකදීය ශිෂ්‍ය දැන්වීම් පුවරුවක මෙම කාමරය පිළිබඳ දැන්වීම දුටුවේ.

වයසක යුවලක් හා විවාපත් නොවුණ මැදි වියේ දියණියක සිටින ගෙදරක උඩු මහලේ හොඳින් වාතාශ්‍රය සහිත ඉඩකඩ ඇති කාමරයක් ඇයට ලැබුණි. කුඩා කඳු ගැටයක මදක් දුර නගින විට පිහිටි මේ නිවසේ බරාඳයට පෙනෙන පහත මිටියා-වතේ යුරෝපීය ශෛලියෙන් විවිධාකාර හැඩතල සහිතව තැනුණු ගෙවල් නිමාලිකාට කිසියම් නැවුම් බවක් දනවයි. ගෙවල් සීමාවට ඔබ්බෙන් වම් පසින් ඇත්තේ තෙරක් නොපෙනෙන පැසිපික් සාගරයයි. නිමාලිකා එදෙස බලා සිටියාය. වෙරළට මදක් ඈතින් මුහුදේ කුඩාවට බිහිවන රළක් තවත් රළ හා එක් වී රළ පෙලක් බවට හැරේ. ක්‍රමයෙන් වේගවත් වෙමින් උස් පහත් වෙමින් පැමිණ වැල්ලෙහි ගැටී ආපසු යද්දී තවත් රළ පෙලක් පැමිණේ. නිමා නොවන ගමනක යෙදී ඇති සැටියකි. නිමාලිකාට මව්බිම සිහිපත් විය. සෑම වසරකම අවසාන දින කීපය කතරගම පූජා භූමියේ ගත කිරීම ඇගේ පවුලේ සිරිතක්ව පැවතුණි. ඒ යන ගමනේදී මෝටර් රථයේ පසුපස අසුනේ වාඩිවන නිමාලිකාත් මල්ලීත් මුහුද පැත්තේ අසුනට පොර කති. පොරය අවසන් වන්නේ අම්මා පසුපස අසුනට පැමිණ මල්ලී තාත්තා ළඟ වාඩි කරවීමෙනි. මල්ලීත් තමාත් අතර නිතර වන අඬදබර සිහිවී නිමාලිකාගේ මුවගට සිනාවක් නැගුණේ නිතැතිණි.

බැංකුවක විධායක නිලධාරියෙකු වූ පියාත්, රජයේ උපාධිධාරී ගුරුවරියක වූ මවත් නිමාලිකා සහ අමාලි ගැන තබා ඇති බලාපොරොත්තු බොහෝය. කෙසේ හෝ වියදම් කොට දරුවන් දෙදෙනාටම හැකි තරම් ඉහලට ඉගැන්වීමට මව්පිය දෙදෙනාම අදිටන් කර ගෙන සිටිති. දියණිය ඉගෙනීමට අදක්ෂ නොවූවද කොළඹ තරඟකාරීත්වය ඉදිරියේ ඇයට ජය ගත නොහැකි විය. අධික වියදමක් දරා ඇය නවසීලන්තයේ සරසවියකට ඇතුලත් කරවනු ලැබුවේ කෙසේ හෝ එකම දියණිය උපාධිධාරිණියක් කල යුතුය යන අවශ්‍යතාවය දැඩිව දැනුණ හෙයිනි. නිමාලිකා ද ඒ බව හොඳින් දැන සිටියාය.

ජනේලයෙන් එපිට බලාගෙන කල්පනාවේ ගැලී සිටි නිමාලිකාට ආසන්න නිවසක ලී වැටට හේත්තු වී සිටින පියකරු සුදු යුවතියක නෙත ගැටුණි. රතු පැහැති ජර්සියකින් සැරසී සිටි ඇය කොණ්ඩය මුදුනට කොට පෝනිටේලයක් සේ ගැට ගසා සිටියාය. ඇගේ උරහිස හා ලී වැට සම උසින් තිබුණි. වැටේ හරස් ලීය උඩ සිටින සුදු සහ දුඹුරු පැහැති බළලෙක් හෙමි හෙමිහිට යුවතියගේ මුහුණේ තැවරෙයි. යුවතියද මුහුණ එහාට මෙහාට හරවමින් බළල් හුරතලයට ඉඩ දෙයි. මොහොතකින් ඈත වංගුවෙන් මතුවූ කළු පැහැති මෝටර් රථයක් යුවතිය අසල නතර වුණි. යුවතිය එය බලාපොරොත්තුව සිටියා සේ මදක් ඉදිරියට ගියාය. රියදුරු අසුනේ සිටි තරුණයා මදක් ඉදිරියට නැමී යාබද අසුනේ දොර විවෘත කලේය. යුවතිය කාරය වෙත සමීප වන විට බළලාද පස්සෙන් වැටුණි. බොරු තරහක් පෙන්නා බළලා නිවස දෙසට එළවා දැමූ යුවතිය සිනාසෙමින් රියට නැගුණාය. තරුණයා පැමිණි වේගයෙන්ම රිය මුහුදු තීරය දෙසට පදවා ගෙන ගියේය.

නිමාලිකා මොහොතක් දෑස වසා ගෙන සිටියාය. සිත තුල ඇඳුණ සංජයගේ සිනාබර මුහුණ ඇය හා දොඩමළු වෙන්නාක් මෙන් දැනුණි. පෞද්ගලික පංතියකදී දැන හඳුනා ගත් සංජය එම උපකාරක පංති වලට සහභාගි වීම සඳහා ගාල්ලේ සිට සෑම සති අන්තයකම කොළඹ පැමිණියේය. ඔහු කෙසේ හෝ කඩඉම ජයගෙන විශ්ව විද්‍යාලයට ඇතුලත් වීමට සමත් විය.

සංජය දක්ෂයි  නිමාලිකා සිතුවාය. කෙසේ හෝ ඔහු විශ්ව විද්‍යාලයෙන් පිටවී හොඳ රැ කියාවකට යනු ඇත. එවිට දෙමව්පිය අවසරය ඇතිව දෙදෙනාට විවාහ විය හැකිය. අධ්‍යාපනය නිම කොට රැ කියා-වක් සොයා ගන්නා තුරු ගෙදරට නොකියා ඉමු  යි දෙදෙනාම ගිවිස ගෙන ඇත. රටින් පිට වූ දා සිටම ඇගේ එකම අරමුණ වූයේ හැකි තරම් හොඳින් ඉගෙනීම් කටයුතු අවසන් කොට ආපසු ලංකාවට යාමය.

අනේ සංජය.. මට හරි පාළුයි මෙහෙ... මං ලංකාවෙ හිටිය නම් අපි කොහොම හරි මුණ ගැහෙනවනෙ.. ඇගේ දෑසට කඳුළු උනා ගෙන ආවේය. එසැණින් දුරකථනය නාද විණි.  කෝල් ෆො යූ නිමාලිකා  යි පහත මාලයේ සිට බියන්කා හඬ නගා කීවෙන් ඇය වහා පහලට දුව ගොස් රිසීවරය ගත්තාය.

කෙල්ලෙ මේ මං... අද හවස අපි යනව ෆිල්ම් එකක් බලන්න. එනවද?

සඳුනිගේ හඬ ඇය වහා හඳුනා ගත්තාය. සඳුනි ඔස්ට්‍රේලියාවේ සිට පැමිණ උපාධියක් හදාරණ ශ්‍රී ලාංකික සිසුවියකි. ඉතා දඟකාර කෙළිලොල් යුවතියක වූ ඇයට මිතුරු මිතුරියන් බොහෝය. සරසවි බිමේදී මුලින්ම මුණ ගැසුණු දා ළඟට විත් කතා කලේද ඇයමය.

අනේ සඳුනි... රිපෝට් එකක් දෙන්න තියෙනව සඳුදට. අදයි හෙටයි කොහොම හරි කරල ඉවර කරන්නයි ඉන්නෙ. සොරි..ඔයාල යන්න. තරහ වෙන්න එපා හොඳේ...

ඔහොම පොතේම එබිල හිටියොත් ඔයා ලෙඩ වෙයි. එන්න ළමයො..

කොතෙක් පෙරැ ත්ත කලද නිමාලිකා අවනත නොවූයෙන් නෝක්කඩුවක්ද කියාගෙන සඳුනි රිසිවරය තැබුවාය. ඇගේ ඉල්ලීමට පිටු පෑමට නිමාලිකාට තවත් හේතුවක් තිබුණි. සඳුනි කොහේ යතත් එකට යන එන කීප දෙනෙක් සිටියහ. ඒ අතර සිටි හෂාන් නිමාලිකා මුණ ගැසුණු විට ඈ දෙස බලන ආකාරයේ කිසියම් අමුත්තක් ඇතැයි ඇයට හැඟී ගොස් තිබුණි. මීට පෙර හමුවූ කිහිප වතාවකම සිසිල් බීමක්, අයිස් ක්‍රීම් එකක් තමාට පළමුව දෙන්නට උත්සාහ කරන අයුරු, එළිමහනක වාඩි වෙද්දී තමා අසලම වාඩි වෙන්නට උත්සාහ කරන අයුරු ඇයට ඉවෙන් මෙන් දැනුණි. ඒ හැම විටෙකම සියළු සිතුවිලි පරදා සංජය ඉදිරියට ආවේය. තමා කොහේ ගියත් කවදාවත් සංජයට ද්‍රෝහි වෙන්නේ නැතැයි දී ඇති පොරොන්දුව සිහිපත් විය. එහෙයින් හැකි සැම විටම හෂාන් මග හැරීමට නිමාලිකා උත්සාහ කලාය.

දිනක් සවස් යාමයේ පුස්තකාලයේ වාඩිවී පොතකින් සටහන් ගොනු කරමින් සිටි නිමාලිකාට අසල වූ හිස් අසුනේ කෙනෙකු ශබ්ද නොනගා වාඩි වෙනු දැනිණ. ඇය පාඩුවේ තම වැඩය කර ගෙන ගියාය. ටික වෙලාවකට පසු හිස ඔසවා අත බැඳි ඔරලෝසුව දෙස බලද්දී යාබද අසුනේ සිටි සිසුවා හා නෙත ගැටිණ. දෙයියනේ... හෂාන්.. මෙච්චර වෙලා මෙයාද මා ළඟ ඉඳගෙන හිටියේ?... නිමාලිකාගේ හිත ගැස්සිණ.
ඇයි?... තරහද මං මෙතන ඉඳ ගත්තට?...
නෑ.. ඇයි එහෙම ඇහුවෙ?...  නිකම්... ඔයා මාව දැක්කම දුවනවනෙ..

ශ්‍රියා කුමාරසිංහ
නවසීලන්තය

නිමාලිකා කිසිත් නොකියා සිනාසී හෂාන් දෙස බැලුවාය. ඒ දෑසේ බැල්මට ඇගේ සිත කීරි ගැසී ගියේය. දෙයියනේ.. මේ මොකද වෙන්න යන්නෙ?..ඇය වහා පොත් ටික එකතු කර ගෙන නැගී සිටියාය.

ඔය.. මං කිව්වෙ...  නෑ හෂාන්. මට දැන් ලෙක්චර් එකක් තියෙනව.  නිමාලිකා ඔහුගෙන් ගැලවී යන්නට කටට ආවක් කියුවාය.

නෑ .. ඔයාට දැන් මුකුත් නෑ.  ඔය යන්නෙ මං මෙතනට ආව නිසා..

තවත් දුර දිග යාමට පෙර දෙකින් එකක් බේරා ගත්තොත් හොඳ යයි නිමාලිකාට සිතුණි. ඇය නැවත පොත් ටික මේසය මත තබා වාඩි වූවාය. එක එල්ලේ හෂාන් දෙස බලා යමක් කීමට තැත් කලද ඒ දෑස ඉදිරිපිට ඇය නිරුත්තර විය. එහෙයින් බිම බලා ගෙනම කතාව පටන් ගත්තාය.

ඔයා හොඳ කෙනෙක්...හරිම හොඳ කෙනෙක්.. මං පහුගිය දවස්වල ඉඳල ඒක හොඳින් තේරුම් අරන් උන්නෙ..ඒත් මට සමාවෙන්න හෂාන් මෙහෙම උත්තරයක් දෙන්න උන එකට.  මම පොඩි බබෙක් නෙවෙයි. මට තේරෙනව ඔයාගෙ හිත. මට කරන්න අමාරුම දෙයක් තමයි කෙනෙකුගෙ හිත රිද්දන එක. ඒත් මට මේක නොකියා බැහැ. මං ලංකාවෙන් එන්න ඉස්සර ඉඳලම  කෙනෙකුට ආදරය කරනව. එයාට මම කියල තියෙනව කොච්චර ලොකු සම්පතක් ලැබුණත් මං ඒ පොරොන්දුව කඩ කරන්නෙ නැහැ කියල...  ඇයට ඉකි ගැසිණ. හෂාන්ගේ මුවින් දිග සුසුමක් පිටවනු ඇයට දැනිණ.

මට ආදරේ හිතුනෙ ඔයාගෙ රූපෙට නෙමෙයි නිමාලිකා... ඔයා හරි ලස්සනයි. ඒක වෙනම කතාවක්. ඒත් මගෙ හිත ඇදිල ගියෙ ඔයාගෙ තියෙන අහිංසක කමට. ඒ සුන්දර අහිංසකත්වය මම වෙන කිසිම ගෑණු ළමයෙක් ළඟ දැකල නැහැ. කමක් නැහැ... මම හිත හදා ගන්න උත්සාහ කරන්නං..

වෙනත් කිසිවක් නොදොඩාම ඔහු සෙමින් නැගිට කියවීම් ශාලාවෙන් පිටවී ගියේය. හිස ඔසවා එදෙස බැලීමට තරම් ධෛර්යයක් නිමාලිකා සතුව නොතිබුණි. ඇය බොහෝ වෙලාවක් මේසයට හිස තබාගෙන කඳුළු වැගිරුවාය. හෂාන් වෙනුවෙන් තම ඇසින් කඳුළු ගලන්නේ ඇයිදැයි නිමාලිකාට තේරුම් ගත නොහැකි විය.

ඒ සිද්ධියෙන් පසු කිහිප වතාවක් නිමාලිකා සහ හෂාන් සරසවි බිම තුලදී මුණ ගැසුණද එකි-නෙකා මග හැර යන්නට දෙදෙනාම වග බලා ගත්හ. ඇය සිතේ දුක සහ පාළුව තුනී කරගනු වස් දිනපතාම සංජයට ලිපි ලීවාය. සංජයගේ සේයාරුව අතට ගෙන  මේ හිත කවදාවත් වෙනස් වෙන්නෙ නෑ රත්තරන්...  යයි කීවාය. මාස කිහිපයක් ගත වී ගියේය. කෙමෙන්

30 වන පිටට